# උත්ථාන සමයේ සයවන සතිය
# බ්‍රහස්පතින්දා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ගත් පාඨයෙකි.

ක්‍රියා 18: 1-18

**"පාවුලු ඔවුන් සමඟ නැවතී වැඩ කළේය.**
**ධර්ම ශාලාවේ දී විවාද කළේය."**

මින්පසු පාවුලු ඇතන්ස් නුවරින් පිටත්ව, කොරින්තියට පැමිණියේ ය. එහිදී ඔහුට මෑතක දී ඉතාලියට පැමිණි පන්තස්හි උපන් අකිලා නම් එක්රා ජුදෙව්වරයෙක් මුණ ගැසුණේය. ක්ලෞදියස් සියලු ජුදෙව්වරුන්ට රෝමයෙන් අහක්ව යන්නට අණ කර තිබුණු බැවින් ඔහු ප්‍රිස්කිලා නම් සිය බිරිඳ සමඟ කොරින්තියට පැමිණ සිටියේය. පාවුලු ඔහු හමුවීමට ගියේය. දෙගොල්ලම එකම කර්මාන්තය කරන්නන් වූ බැවින් පාවුලු ඔවුන් සමඟ නැවතී වැඩ කළේය. ඔවුන්ගේ කර්මාන්තය කූඩාරම් සෑදීම ය. පාවුලු සියලු සබත් දවස්වල ධර්ම ශාලාවෙහි දී වාද කර ජුදෙව්වරුන් ද ග්‍රීක්වරුන් ද ඇදහිල්ලට පමුණුවා ගන්නට උත්සාහ කළේය.

සීලස් ද තිමොතියස් ද මසිදොනියෙන් ආ කල ජේසුස් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේම යයි පාවුලු ජුදෙව්වරුන්ට සාක්ෂි දෙමින් ධර්මය දේශනා කිරීමේ කාර්යයෙහිම නිරත විය. එහෙත් ඔවුන් විරුද්ධව සිට අපහාස කළ කල්හි, පාවුලු තමාගේ වස්ත්‍රවල ධූලි ගසා දමා, ඔවුන්ට කතා කොට "ඔබගේ ලේ ඔබගේම හිස් පිට වැගිරේවා. මම නිදොස් වෙමි. මෙතැන් පටන් විජාතීන් වෙතට යමි" යි කීය. ඔහු එතැනින් නික්ම ගොස් දෙවියන්

වහන්සේට නමස්කාර කළ තීතස් ජුස්තස් නම් මිනිසකුගේ ගෙදරට ගියේය. ඔහුගේ නිවස ධර්ම ශාලාවට යාව තිබිණි. ධර්ම ශාලා මූලාදෑනියා වූ ක්‍රිස්පස් තමාගේ ගෙයි වැසි සියල්ලන් සමඟ ස්වාමින් වහන්සේ අදහා ගත්තේය. කොරින්තිවරුන්ගෙන් බොහෝ දෙනෙක් ද පාවුලුගේ බස් අසා අදහා ගෙන බෞතීස්ම ස්නාපනය ලැබූහ.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 98 : 1–4

පිළිතුර: මිහිපිට සියලු දෙනා අප දෙවිඳුන්ගේ ජයග්‍රහණය දුටුවෝය.

ගීය:

සමිඳුන්ට නව ගීයක් ගයන්න. මන්ද, එතුමාණෝ අසිරිමත් ක්‍රියා කළ සේක.
සිය බලයෙන් හා ශුද්ධ ශක්තියෙන් ජයග්‍රහණය ලත් සේක. සමිඳාණෝ ස්වකීය ජයග්‍රහණය ප්‍රකාශ කළ සේක.

විජාතීන්ගේ ඇස් හමුයෙහි සිය විමුක්ති බලය එළිදරව් කළ සේක. එතුමාණෝ ඉශ්‍රායෙල් වංශය කෙරෙහි එතුමන්ගේ ප්‍රේමයත් විශ්වාසවන්තකමත් සිහි කළ සේක.

මිහිපිට සියලු දෙනා අප දෙවිඳුන්ගේ ජයග්‍රහණය දුටුවෝය.
එම්බා ලෝ වැසි සියල්ලෙනි, සමිඳුන් හට ප්‍රීතියෙන් ගී ගයන්න.
ප්‍රීති ගී ගයමින් එතුමන් පසසන්න.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
“උත්ථාන කරනු ලැබූ ක්‍රිස්තුස් වහන්සේ යළිත් නොමැරෙන බව ද අපි දනිමු.
මින්මතු මරණය උන්වහන්සේ කෙරෙහි බලපවත්වන්නේ නැත.”
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක ජුවාම්තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 16: 16-20

**“ඔබේ දොම්නස සොම්නසට හැරෙනු ඇත.”**

“ස්වල්ප වේලාවකින් ඔබ මා තවත් නොදක්නහුය. එහෙත් තව ස්වල්ප වේලාවකින් ඔබ මා දක්නහුය” යි ජේසුස් වහන්සේ වදාළ සේක. එබැවින් උන්වහන්සේගේ ශ්‍රාවකයන්ගෙන් සමහරෙක් තම තමන් අතරේ කතා කර ගනිමින් “ස්වල්ප වේලාවකින් ඔබ මා තවත් නොදක්නහු ය. එහෙත් තව ස්වල්ප වේලාවකින් ඔබ මා දක්නහුය” කියා ද එයට හේතුව “ මා පියාණන් වහන්සේ වෙතට යන නිසාය” කියා ද උන්වහන්සේ අපට වදාරන මේ කතාව කුමක්දැ” යි කීහ. උන්වහන්සේ ස්වල්ප වේලාවකැ” යි කියන මේ දේ කුමක්ද? උන්වහන්සේ කියන කතාව අපට නොතේරේ” යයි කීහ.

ඔවුන් තමන් වහන්සේගෙන් ප්‍රශ්න කරන්නට අදහස් කළ බව ජේසුස් වහන්සේ දැන, මෙසේ ඔවුන්ට වදාළ සේක. 'ස්වල්ප වේලාවකින් ඔබ මා තවත් නොදක්නහුය. එහෙත් තව ස්වල්ප වේලාවකින් ඔබ මා දක්නහු' යයි මා කී මේ කරුණු ගැන ඔබ විචාරන්නහු ද? ඒකාන්තයෙන්ම මම ඔබට කියමි ඔබ හඬා වැලපෙන්නහු ය. එහෙත් ලෝකයා ප්‍රීති වන්නාහ. ඔබ දොම්නස් වන නමුත් ඔබේ දොම්නස සොම්නසට හැරනු ඇත".

සුවිශේෂ වාක්‍යය එසේය.